**දඹුල්ල ප්‍රාදේශීය සභාව.**

**--------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**----------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ 2012, 2013 යන වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**2.1 ආදායම් පරිපාලනය.**

**--------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථාපිත කර ඇති සම්ප්‍රේෂණ කුළුණු වලින් සමාලෝචිත වර්ෂයට අදාල රු.54,000 ක බලපත්‍ර ගාස්තුද, වෙළඳ ප්‍රචාරන හා දැන්වීම් පුවරු වලින් අයවිය යුතු රු.21,300 ක බලපත්‍ර ගාස්තුද අයකර ගෙන නොතිබුණි.

(ආ) සීගිරිය රථ වාහන නැවතුම්පලෙන් මාස 07 ක් සඳහා අයවිය යුතු රු.143,558 ක බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**----------------------------**

**3.1 කළමණාකරන අකාර්යක්ෂමතා.**

**----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කාර්මික නිලධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් අදාළ ස්ථාන වල ස්ථානීය පරීක්ෂාවන් සිදු නොකර රු.70,540 ක වටිනාකමකින් යුත් අනුකූලතා සහතික 6 ක් සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර තිබුණි.

(ආ) 2013 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී කාර්යාල පොදු ගබඩාවේ නිරීක්ෂණය වූ භාණ්ඩ ඒකක 313 ක ඌණතාවයන් සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ නිවාඩු සහ සති අන්ත දින වල 1/20 දීමනා මත සේවය කිරීමේදී දිනකට පැය 8 ක් සේවය කළ බව සහ එදිනට පෙර හා පසු දින රාජකාරියේ යෙදුනු බව තහවුරු කර නොගෙන ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 9.1 , 10.1 සහ 10.2 වගන්ති වල විධිවිධාන වලට පටහැනිව වැඩ අධිකාරිවරයාට රු.84,797 ක මුදලක් 1/20 දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) විවිධ ආයතන වෙතින් ලැබී තිබුණු වාහන 03 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි

(ඉ) විගණන හා කළමණාකරන කමිටු පිහිටුවා තිබුණු නමුත්, කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

----------------------

(අ) සෞඛ්‍ය කටයුතු, මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු අධීක්ෂණය සඳහා මසකට දින 05 ක නිවාඩු දින රාජකාරී සඳහා නිවාඩු දින වැටුප් ලබාගත හැකි වුවත්, පළාත් පාලන අමාත්‍යංශ ලේකම්ගේ 2000 නොවැම්බර් 30 දිනැති අංක 1/2000 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව එකී සීමාවන් ඉක්මවා දින 13 ක් සඳහා රු.19,701 ක් සමාලෝචිත වර්ෂයේදී වැඩ අධිකාරිවරයාට ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී විධිමත් අනුමැතියක් ලබා නොගෙන සභාවේ නිලධාරීන් තිදෙනෙකුට පැය 269 ක් සඳහා රු.20,380 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

**------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභා අරමුදලින් රු.300,000 ක් වියදම් කර කලාපුරය පුරාණ නාගස්ලෙන මාර්ගය බෝක්කු දමා සංවර්ධනය කිරීම පිළිබඳව 2015 අප්‍රේල් 21 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී හියුම් පයිප්ප සපයා සවිකර ඇතත්, එකී හියුම් පයිප්ප සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි මාර්ගය සකසා පස් පුරවා නොතිබුණු බවත්, යොදන ලද සිමෙන්ති කොන්ක්‍රීට් පුපුරා ගොස් ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) බාහිර පාර්ශ්වයන්ට අයත් ඉඩම් වල රු. 3,450,000 ක වියදමින් ගොඩනැගිලි 02 ක් සහ ක්‍රීඩාංගනයක් ඉදිකර තිබුණු නමුත්, එම ඉඩම් සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සංවර්ධන යෝජනා (පළාත් නැගුම) යටතේ රු.5,000,000 ක ප්‍රතිපාදන මත සීගිරිය පොල්අත්තාව මාර්ගය තාර දැමීමට අදාළ කොන්ත්‍රාත්තුව කොටස් 3 කට බෙදා කොන්ත්‍රාත් තුනක් ලෙස අදාළ ගොවි සංවිධානය සමඟ එකම මස ගිවිසුම් වලට එළඹී තිබුණි. එය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය සහ 2011 සැප්තැම්බර් 27 දිනැති අංක 452 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූල නොවන තත්ත්වයක් විය.

**3.4 ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය.**

**-------------------------------**

පුස්තකාල භූමියේ ඉදිකර ඇති කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගෙන දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන කසල සතියකට දින දෙකක් බැගින් එකතු කර දිගම්පතහ පිහිටි තේක්ක රක්ෂිතයට අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. ඝණ අපද්‍රව්‍ය සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිචක්‍රීකරණ වැඩ පිළිවෙලකට යොමුවී නොතිබුණි.

**3.5 නොවිසිඳී ඇති හා පිලිතුරු නොලත් විගණන විමසුම.**

**---------------------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 04 කට පිලිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.571,589 විය.

**4. පද්ධති පාලන**

**----------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය.

(ඇ) වාහන පාලනය

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය